# සංක්ෂිප්තය

ළමා පෞරුෂය හැඩ ගැස්වීමේ සුවිශේෂ වගකීමක් හිමිව ඇති පාසල් පද්ධතිය තුළ සමස්ත විෂයමාලාවේ ක්‍රියාත්මක තත්ත්වය තුළින් ළමා අධ්‍යාපන අයිතියට සිදුකරන බලපෑම පිළිබඳ සොයා බැලීම අරමුණු කරගෙන මෙම අධ්‍යයනය සිදුකර ඇත.

මේ සඳහා කොළඹ අධ්‍යාපන කලාපයේ බොරැල්ල අධ්‍යාපන කොට්ඨාසයට අයත් නාගරික ජනාකීර්ණ පරිසරයක පිහිටි පාසලක් පදනම් කරගනු ලැබීය. සිසුන් 700ක් පමණ ඉගෙනුම ලබන මිශ්‍ර පාසලක්වූ මෙම විද්‍යාලයේ ඉගෙනුම ලබන බහුතරයක් සිසුන් අඩු ආදායම්ලාභී, වරප්‍රසාද අහිමි පවුල්වලට අයත් ළමුන්වීම විශේෂ කොට සැලකිය හැකිය.

පර්යේෂණ කෘතියේ පළමු පරිච්ඡේදය තුළින් අධ්‍යයන ගැටලුව හඳුන්වාදීම, අධ්‍යයනය සිදුකරන ලද පසුබිම හා අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරනු ලැබීය.

පර්යේෂණ ගැටලුව සම්බන්ධයෙන් පවතින න්‍යායාත්මක හා දේශීය හා විදේශීය පර්යේෂණ සාහිත්‍ය පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම දෙවන පරිච්ඡේදයේදී සිදුවිය.

විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශයේ සමීක්ෂණ ක්‍රමය මඟින් සිදුකරනු ලැබූ මෙම අධ්‍යයනය පහත සඳහන් සුවිශේෂී අරමුණු 4 ඔස්සේ විමර්ශනය කරනු ලැබීය.

1. පාසලේ භෞතික හා මානව සම්පත් අනුව ළමා අයිතිවාසිකම් සුරැකෙන ආකාරය සොයා බැලීම.
2. පාසල තුළ විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක වීමේදී ළමා අයිතිවාසිකම් සුරැකෙන ආකාරය සොයා බැලීම.
3. අවිධිමත් විෂයමාලාව තුළින් ළමා අයිතිවාසිකම් වලට සිදුකරන බලපෑම විමසා බැලීම.
4. සැඟවුණු විෂයමාලාව ළමා අයිතිවාසිකම් කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කිරීම.
5. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා පාසල් පද්ධතිය තුළ අනුගමනය කළ යුතු ක්‍රමෝපායන් යෝජනා කිරීම.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දත්ත රැස්කර ගැනීම සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, සැස්ඳුම් ලැයිස්තු, ලිඛිත වාර්තා, නිරීක්ෂණ ආදිය භාවිතයට ගනු ලැබීය. අධ්‍යයනයට අදාළ කරගත් නියැදිය අදාළ පාසලේ 11 ශ්‍රේණියේ සිසුන්, එම ශ්‍රේණි වල උගන්වන ගුරුවරුන්, විදුහල්පති, දෙමාපියන් හා අධ්‍යාපන නිලධාරීන්ගෙන් සමන්විත විය.

අනාවරණය කරගත් දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය හා අර්ථකථනය කිරීමට 4 වන පරිච්ඡේදය අදාළ කරගන්නා ලදි. අධ්‍යයනය ඇසුරින් ළමා අධ්‍යාපන අයිතිය සුරක්ෂිත වීම පිළිබඳ එළඹි නිගමනයන් මෙසේය.

1 පාසල සතු භෞතික හා මානව සම්පත් ළමා අධ්‍යාපන අයිතිය කෙරෙහි අයහපත් බලපෑම් සිදුකරන අවස්ථා පවතින බව.

2 පාසලේ සැලසුම් සහගත බව හා පරිපාලන රටාව ළමා අධ්‍යාපන අයිතිය කෙරෙහි ඍණාත්මක බලපෑමක් සිදුකරන බව.

3 පාසල තුළ විධිමත් විෂය මාලාව ක්‍රියාත්මක වීමේදී ශිෂ්‍ය අධ්‍යාපන අයිතිය සුරක්ෂණයට බාධා සිදුවන බව.

4 පාසල් සංස්කෘතිය, සැඟවුණු විෂයමාලාව ළමා ආකල්ප සංවර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් සිදු නොකරන බව.

5 ශිෂ්‍ය විනය පාලන ක්‍රමෝපායන් ළමා අයිතිවාසිකම් වලට එරෙහිව ක්‍රියාත්මක වන බව.

6 විෂය සමගාමී ක්‍රියාකාරකම් ශිෂ්‍ය සහභාගීත්ව සහ සංවර්ධනාත්මක අයිතිය කෙරෙහි සුභවාදීව ක්‍රියාත්මක නොවන බව.

7 පූර්ණ ආරක්ෂාව, නොසලකා හැරීමට ලක් නොවීම වැනි අයිතීන් පාසල තුළ ආරක්ෂා නොවන බව

ශිෂ්‍ය අධ්‍යාපන අයිතිය කෙරෙහි සිදුවන අහිතකර තත්ත්වයන් අවම කරගෙන අධ්‍යාපනයෙන් අපේක්ෂිත අරමුණු නිසියාකාරයෙන් ඉෂ්ඨ කරගත හැකි පාසල් පරිසරයක් ගොඩ නගා ගැනීමට කළ හැකි යෝජනා පර්යේෂණ කෘතිය අවසානයේ ඉදිරිපත් කර ඇත.

1 ළමා අයිතිවාසිකම් පිළිබඳ පාසල් ප්‍රජාවගේ අවබෝධය පුළුල් කිරීම.
2 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම.
3 ශිෂ්‍ය විනය හැඩගැස්වීමේදී මානව හිතවාදී ඵලදායී අර්ථාන්විත උපක්‍රම අනුගමනය කිරීම.
4 ශිෂ්‍ය කුසලතා හා ආකල්ප වර්ධනයට ආදරය, දයාව සංවේදී බව දනවන අත්දැකීම් ලබාදීමට අවස්ථා සම්පාදනය කිරීම.

මෙසේ ගුරුවරු ඇතුළු වැඩිහිටි සැම ළමා පරපුර වෙනුවෙන් තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටුකරන සමාජ වාතාවරණයක් ගොඩනැගීමට ගන්නා උත්සාහය තුළින් සුන්දර වූත්, අර්ථවත් වූත් හෙට දිනක් ළමුනට උදාකර දීමට හැකිවනු ඇත.